



කාජල්ට වාසනාව ගෙනාවේ දෙවැනි චිත්‍රපටය වූ, බාසිගර්ය. ඇයට ගැලපෙන සිනමාවේ පෙම්වතා ෂාරුක් සමඟ කළ පළමු රංගනය ද ඇතුලත් වූයේ "බාසිගර්" සිනමා පටයටයි. මෙම සිනමා පෙම් යුවල වර්තමාන භාරත සිනමාවේ ජනප්‍රියම පෙම් යුවල ලෙස සැළකෙයි.

"බාසිගර්" ආදායම් වාර්තා තබමින් තිරගත විය. ඇය රංගනයෙන් දායක වූ දිල්ලගී , කරන් අර්ජුන්, දිල්වාලේ දුනියා ලේ ජායෙන්ගේ , ගුප්ත් ඉෂ්ක්, ප්‍යාර් කියා තෝ, ඩර්නා කියා, දුෂ්මන්, ප්‍යාර් තෝ හෝනා හිකා, කුච් කුච් හෝතා හේ, කබි කුෂි කබි ගම්, ෆනා, ඉහළම ආදායම් ලැබූ සිනමාපටයයි. එමෙන්ම, MY NAME IS KHAN ද මේ වන විට ආදායම් වාර්තා බිඳිමින් තිරගත වෙයි. සිනමා පටයක් තම කාන්තා රංගන භූමිකාවෙන් ප්‍රබල කිරීමට හැකි නිළියන් ඇත්තේ අතලොස්සකි. ඔවුන් අතරින් කාජල් වර්තමාන භාරත සිනමාවේ සිටින උපරිම කුසලතා පළ කරන රංගන වේදිනිය බව බොහෝ දෙනෙකුගේ අදහසයි.

## විවිධ වූ සම්මාන

දිල්වාලේ දුනියා ලේ ජායෙන්ගේ (1995) බොලිවුඩයේ එදා මෙදා තුර දෙස් විදෙස් වශයෙන් ඉහළම ආදායම් ලද සිනමා පටයක් වූවාක් මෙන්ම ඇයට ෆිල්ම් ෆෙයාර් සම්මානය හොඳම නිළිය ලෙස ලැබුණේ ද මෙහි කළ රංගනයටයි.
හොඳම දුෂ්ට චරිත රංගනයට ෆිල්ම් ෆෙයාර් සම්මාන දිනාගත් පළමු නිළියද කාජල් ය. ගුප්ත් (1997) එම රංගනය ඇතුලත් සිනමා පටයයි.
තමන් රංගනයෙන් දායක වූ පළමු ද්‍රවිඩ සිනමා පටය වූ "මින්සාර් සිනවු" හි පෑ කුසලතාවයට දකුණු ඉන්දියානු සිනමා පට වෙනුවෙන් පැවැත්වෙන ෆිල්ම්ෆෙයාර් සම්මාන උළෙලෙදී හොඳම නිළියට හිමි සම්මානය දිනාගැනීමට තරම් ඇය භාග්‍යවන්ත වූවාය.

කාජල්ට හොඳම නිළිය ලෙස දෙවැනි ෆිල්ම් ෆෙයාර් සම්මානය පිරිනැමුනේ "කුච් කුච් හෝතාහේ (1998) රංගනයටයි. කබි කුෂි කබි ගම් (2001) සිනමා පටයේ රංගන කුසලතාවය ද "ෆනා" (2006) සිනමා පටයේ අන්ධ තරුණියක ලෙස කළ ප්‍රබල රංගනයට ද ඇය හොඳම නිළිය ලෙස ෆිල්ම් ෆෙයාර් සම්මානය හිමිකර ගත්තාය. මීට පෙර හොඳම නිළිය ලෙස සිව් වරක් සම්මාන දිනාගෙන ඇත්තේ මීනා කුමාරි හා මධුරි ඩික්සිත් පමණය.

මේ වන විට කාජල් දස වරකට වඩා ෆිල්ම් ෆෙයාර් සම්මාන උළෙල වලදී හොඳම නිළිය ලෙස නිර්දේශ වී තිබේ. ෆිල්ම් ෆෙයාර් සම්මාන වලට අමතරව සී ( Z ) සිනේ සම්මාන වැලෙන් සිනෙස් අන්තර් ජාතික සම්මාන , ස්ක්‍රීන් වීක්ලි සම්මාන ඇතුළු සම්මාන ගණනාවකටම කාජල් හිමිකම් කියන්නීය.

## සමාජ සේවිකාවක්

ඇය සිනමා තරුවක් වූවත් මහ පොළොව මත පය තබා සිටින, සිහින ලොවක ජීවත් නොවන තරුවක් ලෙස ප්‍රකටය. එනිසා ම ඇය දුප්පතුන් ගේ දුක හඳුනන ශිල්පිනියකි. වැන්දඹුවන් ගේ දරුවන්ගේ අධ්‍යාපනයට ආධාර දෙන පදනමක ඇය සාමාජිකාවකි. ඒවාගේ ම ශික්ෂා නම් රාජ්‍ය නොවන සංවිධානයක ද ඇය කටයුතු කරන්නීය.

## වෘත්තීය සහ සම්බර යුගදිවිය

කාජල්, අජේ දේව්ගන් සමඟ විවාහ වන විට රංගන කුසලතාවයන්ගෙන් හා ජනප්‍රියත්වයෙන් ඉහළම හිණි පෙත්තේ සිටිය ද විවාහයෙන් පසු ඇය වසර පහක් ම රංගනයෙන් ඈත් වී සිටියාය. ඒ සැමියා හා කුඩා දියණිය වෙනුවෙන් කළ උදාර කැපවීමකි. දැන් ඇය රඟපාන්නේ තෝරා ගත් සීමිත සිනමා පට කිහිපයක පමණි. සෑම විවාහ සංවත්සරයකදී ම අජේ, කාජල්ගේ බිරියක වශයෙන් ඇති උතුම් ගුණාංගයන් අගයන්නේ, කාජල් ගේ උපන් දින උත්සවයේ දී මිළ අධික රථයක් තෑගි දී ඇය පුදුමයට පත් කරන්නේත් මේ නිසා විය හැකිය.
සිනමා පටයකට දායක වීමේ දී පවා , කාජල් නිශා දූ තනි කරන්නේ නැත. සෑම රූගත කිරීමකටම ඇය තම දියණිය රැගෙන යන්නීය.

**චම්පිකා දීපානි රණසිංහ ලියයි.**

කාජල්:– අඩි 5 අඟල් 2 ක් උසය. ඇයගේ ප්‍රියතම විනෝදාංශය පොත් පත් කියවීමයි.
කාජල්ගේ පියා චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකි. ඔහුගේ බිරිය සතිරාණි දේවි, අශෝක් කුමාර්, අනූප් කුමාර්, හා කිෂෝර් කුමාර් යන භාරත සිනමාවේ පතාක යෝධයන් ගේ සොහුරියයි .